# ආයතනගත සහ ආයතනගත නොවන වැඩිහිටියන්ගේ මරණ කාංසාව සම්බන්ධ වෙනස අධ්‍යයනය කිරීම

*කේ. හිමාලි එරන්දිකා* [1]
*කුඹුකන්දන රේවත හිමි* [2]

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

සංක්ෂේපය

වර්තමානය වන විට වයෝවෘද්ධ භාවයට පත් ව මිය යන සංඛ්‍යාව අධික වෙමින් පවතින නිසා වැඩිහිටි භාවය ආශ්‍රිත ගැටලු විශ්වය පුරා පැහැදිලි ව විද්‍යාමාන වෙමින්, එක්තරා සංකීර්ණ අර්බුද නිර්මාණය වීමට තුඩු දී ඇත. මේ හේතුකොටගෙන වියපත් පිරිස ආශ්‍රිත ව නිර්මාණය වන සුවිශේෂ අර්බුද කෙරෙහි මනෝවිද්‍යාත්මක අවධානය යොමු කිරීමේ දැඩි අවශ්‍යතාවක් මතු ව පවතී. විශේෂයෙන් ම වියපත් පුද්ගලයන් මරණය පිළිබඳ අනවශ්‍ය තරමට කල්පනා කිරීම හේතුකොටගෙන ඇතිකරගනු ලබන මානසික ගැටලුකාරී තත්ත්වයක් ලෙස මරණ කාංසාව හඳුනාගත හැකිය. මෙවැනි පසුබිමක් යටතේ වත්මන් පර්යේෂණයේ දී පර්යේෂකයා විශේෂ අවධානය යොමු කරනුයේ මහලු වියට පත් පුද්ගලයන්ගේ මරණ කාංසාවේ ස්වභාවය කෙබඳු ද යන්න පරීක්ෂා කර බැලීමයි. ඒ අනුව මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණු වන්නේ ආයතනගත ව දිවි ගෙවන වැඩිහිටියන් සහ ආයතනගත නොවන වැඩිහිටියන්ගේ මරණ කාංසාව සම්බන්ධයෙන් පවතින වෙනස අධ්‍යයනය කිරීම සහ ස්ත්‍රී-පුරුෂ භාවය අනුව ආයතනගත සහ ආයතනගත නොවන වැඩිහිටියන්ගේ මරණ කාංසාවේ ස්වභාවය හඳුනාගැනීමයි.

මෙහි ප්‍රධාන උපන්‍යාස වන්නේ අ) ආයතනගත වැඩිහිටියන් ආයතනගත නොවන වැඩිහිටියන්ට වඩා මරණ කාංසාවෙන් පෙළෙයි. ආ) මහලුවියේ පුරුෂයන්ට සාපේක්ෂ ව ස්ත්‍රීන් වැඩි වශයෙන් මරණ කාංසාවෙන් යුක්ත වේත යනාදිය යි. අධ්‍යයනය සඳහා යොදාගත් සමස්ත නියැදිය 60 ක් වන අතර එය ස්ත්‍රී පුරුෂ 15 බැගින් ආයතනගත වැඩිහිටියන් 30 ක් සහ ආයතනගත නොවන වැඩිහිටියන් 30ක ගෙන් සමන්විත වේ. මෙහි දී කොළඹ දිස්ත්‍රික්කයේ අවුරුදු 65- 90 වයස් කාණ්ඩයට අයත් වැඩිහිටියන් අතුරින් සසම්භාවී නියැදුම් ක්‍රමයට අනුව දත්ත රැස් කරනු ලැබීය. දත්ත රැස් කිරීම සඳහා ටෙම්ප්ලර්ගේ මරණ කාංසා පරිමාණය (Templer 1970) යොදා ගැනීම සිදු විය. අදාළ ප්‍රශ්නාවලිය නියැඳිය වෙත ලබා දීමෙන් අනතුරුව ඒකරාශී කරගනු ලැබූ දත්ත SPSS මෘදුකාංගය යොදාගනිමින් විශ්ලේෂණය කෙරේ. දත්ත විශ්ලේෂණයේ ප්‍රතිඵලවලට අනුව ආයතනගත වැඩිහිටියන්ගේ මධ්‍යනය අගය 24.4667 ක් වූ අතර ආයතනගත නොවන වැඩිහිටියන්ගේ මධ්‍යනය අගය 23.6667 ක් විය. ඒ අනුව ආයතනගත වැඩිහිටියන් ආයතනගත නොවන වැඩිහිටියන්ට වඩා මරණ කාංසාවෙන් යුක්ත බව සනාථ වේ. එමෙන් ම ආයතනගත ස්ත්‍රීන්ගේ මරණ කාංසාවේ මධ්‍යනය අගය 24.8 ක් වූ අතර ආයතනගත පුරුෂයන්ගේ මරණ කාංසාවේ මධ්‍යනය අගය 24.1 ක් විය. ඒ අනුව ආයතනගත ස්ත්‍රීන් සහ පුරුෂයින්ගේ මරණ කාංසාව සම්බන්ධ කැපීපෙනෙන වෙනසක් නොමැති බව දක්නට හැකි විය. තවද ආයතනගත නොවන පුරුෂයින්ගේ මරණ කාංසාවේ මධ්‍යනය අගය 24.1333 ක් වූ අතර ආයතනගත ස්ත්‍රීන්ගේ මරණ කාංසාවේ මධ්‍යනය අගය 23.2 ක් ලෙස වාර්තා වේ. ඒ අනුව ආයතනගත නොවන වයස්ගත පුරුෂයන් ස්ත්‍රීන්ට වඩා වැඩි මරණ කාංසාවකින් යුක්ත බව තහවුරු වේ. මෙම පර්යේෂණයේ සමස්ත ප්‍රතිඵලවලට අනුව ඥාතීන්ගෙන් වියෝව වැඩිහිටි නිවාසවල හුදකලාව ජීවත් වීමට සිදුවීම වැඩිහිටියන්ගේ මරණ කාංසාව ඉහළ යාමට හේතු වන බව නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පද : වැඩිහිටි මරණ, ශ්‍රී ලංකාව

1 *දර්ශන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව;* himalierandikakuragama@gmail.com
2 *දර්ශන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*